ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 6 4 6 7 8
LONDON NW3 9LS
E N G L A N D


*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 1 9 0 0 5 1 6 3
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna

පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal

ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam

# මැද පෙරදිග අපා දුක කවදා කෙළවර වේද?

සවුදි අරාබියාවට වැඩට ගිය මාතර පළාතේ කාන්තාවක් මාස පහකට පසු ආපසු ගෙදර ආවේ ඇඟ පුරා ගසනලද ඇණ සහ ඉඳිකටු **24** ක් ද සහිතවය. මේ ගැන දැනට විශාල ආන්දෝලනයක් පවතින බව ලංකාවේ පළවන ප්‍රවෘත්ති වලින් පෙනේ. තව ටික දිනකින් ඒ සිද්ධිය කාටවත් මතක නැතුව යනවා ඇත. දැන් ඇති කළබලය මේ මොහොතට පමණය. ශ්‍රීලංකාවේ කවදත් හැටි එහෙම ය.


ආරියවති නමැති ඇය රැකියාවේ නිරත වු සවුදියේ නිවසේ හාම්පුතුන් ඇයට අනේක වධ හිංසා දුන් බවත්, ගිනියම් කළ ඇණ ඇඟට ගැසූ බවත්, ඒ ගෙදර පොඩි ළමයින් පවා ඇයගේ බෙල්ලට පිහියක් තබා බෙල්ල කපා දමන බව කී බවත් ඇය ලංකාවේදී වෛද්‍ය-වරයෙකු හමුවූ විට පවසා ඇත. ඒ අනුව රෝහල් ගත කළ ඇයගේ ශරීරය තුළ තිබූ යකඩ ඇණ **24** ක් ශල්‍ය වෛද්‍යවරු ඉවත් කළහ. ලංකා රජයෙන් කළ දෝෂාරෝපණ වලට පිළිතුරු වශයෙන් සවුදි රජය කියන්-නේ ආරියවතිගේ කතාව බොරුවක් බවත් වන්දි ලබා ගැනීමේ අදහසින් ඇය එවැනි කතාවක් ගොතා කියා ඇති බවත්ය. එසේම එය තම රටට අපකීර්තියක් එක් කරන්නට මැවූ ප්‍රවෘත්තියක් බවයි. මේ ගැන දෙරටම තවම පරීක්ෂණ පවත්වන බව කියති.

එහෙත් ලංකා ගෘහසේවිකාවක් මුහුණ පෑ මේ ප්‍රථම සිද්ධිය නොවේ. සවුදි අරාබියට හෝ මැදපෙරදිග අනෙක් රටවලට හෝ රැකියාවට ගිය ශ්‍රීලංකා ගෘහ සේවිකාවන් තාඩන පීඩන, ගැහුම් බැණුම්, වධ හිංසා, දූෂණයට ලක්වීම් ආදිය පමණක් නොව අතපය කඩාගෙන ජීවිත යටම අංග විකලවීමට ද මැරුම් කන්නට ද සිදුවූ අවස්ථා ද සිය ගණනකි. මේ සංඛ්‍යාව දැන් එන්න එන්නම වැඩිවේ. විදේශ ගත වූ එක්තරා කොටසක අපේ ජනතාවක් ගෙවන මේ අවදානම් ජීවිත ගැන ශ්‍රීලංකාවේම පුවත් පත් වල පිටු දහස් ගණනක් පළවන්නට ඇත. මේ ගැන මීට ඉහත කීපවතාවක් අප ලද සත්‍ය පුවත් මේ පත්‍රයේ ද පළකර තිබේ. එහෙත් මේ ප්‍රශ්නයට කිසිදු විසඳුමක් මේ තාක් සොයාගෙන නැත. කාටවත් කැක්කුමක් නැත.

මැද පෙරදිගට රැකියාවට ගොස් සිටින ලාංකික සංඛ්‍යාව මිලියන **1.4** කි. ගිය වසරේ පමණක් ඒ පිරිස අප රටට ඩොලර් බිලියන යකට වඩා සපයා දී ඇත. සෑම රජයක් ම අය වැය හිඟය පියවාගන්නේ, මැති ඇමති-වරුන් සුඛෝපභෝගී මෝටර් රථ ගෙන්වා-ගන්නේ, ලෝකෙ පුරාම සවාරි ගසන්නේ ඒ සේවක සේවිකාවන් සපයාදෙන විනිමයෙනි. ඉඳ හිට පුවත්පතක ඇමතියෙක් “ මැද පෙරදිග ට යන අපේ සහෝදර ජනතාව තමයි අපේ ආර්ථිකයේ ජීවනාලිය” යනුවෙන් පුහු වචන කීපයක් කියා ඒ මිනිසුන් නග්ගා තබයි. එපමණකි. මැද පෙරදිග අපායවල දුක් විඳින ඒ මිනිසුන්ගේ දුක නිවන්නට අපේ එක ද දේශපාලකයෙක් කිසි පියවරක් ගෙන නැත. ඉදිරියට ගනීවියයි ද මා නම් හිතන්නේ නැත. අපායට ගිහින් වුනත් සල්ලි ගේනව නම්......!

# විසිවන සියවසේ මහා යුග පුරුෂයාණෝ

# අනගාරික ධර්මපාලතුමා






## ලන්ඩන් බෞද්ධ විහාරාධිපති පූජ්‍ය බෝගොඩ සීලවිමල නාහිමියන් විසිනි

ලංකා ඉතිහාසයේ නොයෙක් වීර වරයන්ගේ ශ්‍රේෂ්ඨ ක්‍රියා ගැන අපි අසා ඇත්තෙමු. එහෙත් අනගාරික ධර්මපාල තුමාගේ විශේෂත්වය වන්නේ එතුමාගේ සේවය ලංකාව තුළට පමණක් සීමා නොවීමය. එතුමන්ගේ උත්සාහය නිසා නූතන ඉන්දියාවේ බෞද්ධ පුනරුදය ආරම්භ වුණේය. එසේම යටත් විජිත යුගයේ අනේක විධ බටහිර දේශපාල නික, සංස්කෘතික හා ආගමික බලපෑම් වලට හසුවෙමින් තිබූ ආසියාතික රාජ්‍යයන් තුළින් බටහිරට අධ්‍යාත්මික පණිවුඩයක් දීමට එතුමෝ සමත්වූහ.

ශතවර්ෂ ගණනාවක් බටහිර රාජ්‍යයන්ට යටත්ව තිබීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලාංකික සමාජය තුළ බටහිර අනුකාරක සමාජ කොට්ඨාශයක් බිහි වීය. අධ්‍යාපනය, ආගම, රැකීරක්ෂා හා සමාජ තත්වය රැඳී තිබුණේ බටහිර අනුකරණයට ගැලපෙන්නටය. දේශීය බෞද්ධ සිරිත් විරිත් හා ජාතික ගති පැවතුම් ඉතා පහළට වැටී තිබුණි. මෙම සමාජ විෂමතාව නිසා සංකර සංස්කෘතිය යන යෙදුම භාවිතයට එක්වූයේය. ගම්බද සමාජය දෙස බලන විට මත්පැන් පානය, ගවමස් කෑම වැනි දුසිරිත් වලට නැඹුරු වෙමින් ආගම ධර්මයෙන් ඈත්වීමේ ආදීනව හේතුකොට එය සමාජ පරිහානියක් කරා ශීඝ්‍රයෙන් ඇදී යමින් තිබුණි. මේ නිසා ලාංකික සමාජය, විශේෂයෙන්, බෞද්ධ සමාජය සංශෝධනය කොට ප්‍රතිසංස්කරණයක් කරා යොමුකිරීමට ධර්මපාලතුමා තම ජීවිතයෙන් ආදර්ශයක් දෙමින් අතිමහත් පරිශ්‍රමයක් දැරීය. ඒ සඳහා සිංහළ බෞද්ධ යන සංකල්පය හඳුන්වාදී නිවහල් චින්තාවක් වෙත ලාංකික බෞද්ධ ජනතාව අවදිකළේය. සමාජයේ තිබූ පරාධීන මානසිකත්වය දුරුකොට ශ්‍රේෂ්ඨ ජාතිකත්වයක් ඇතිකිරීම සඳහා ආර්ය සිංහළ යන යෙදුමද භාවිතා කළේය. ඇතැම් විට එතුමාගේ විවේචන කර්කශ එකක් වීය. ධර්මපාලතුමන්ගේ මේ ව්‍යායාමයට හික්කඩුවේ ශ්‍රී සුමංගල, වාදීභසිංහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද වැනි භික්ෂූන් වහන්සේලාගෙන්ද, කර්නල් ස්ටීල් ඕල්කොට්තුමා, බ්ලැවැට්ස්කි මැතිනිය මෙන්ම තම දෙමව්පියන්ගෙන්ද ආශීර්වාදය ලැබුණේය.

ඉන්දියාවේ බුදුදහම පුනරුත්ථාපනය කිරීම සඳහාත්, එය ජාත්‍යන්තරව ප්‍රචලිතකිරීම පිණිසත් ක්‍රි පූ 3 වන සියවසේ ධර්මාශෝක මහා අධිරාජයාණන් ගත් උත්සාහය සම්පූර්ණ වූයේ 20 වන සියවසේ අනගාරික ධර්මපාල තුමන්ගේ ව්‍යායාමය නිසා බව බෞද්ධ ඉතිහාසය දෙස බලන විට පැහැදිලි වෙයි. මහාධිරාජ අශෝකයන් බෞද්ධ සිද්ධස්ථාන ප්‍රතිශ්ඨාපනය කළ අතර එවැනි දේශපාලන බලතල නැතිව ධර්මපාලතුමන්ට හින්දු ශිව භක්තික මහන්තාගේ පාලනයට යටත්ව පරිහා-නියට පත්ව තිබුණු බුද්ධගයා භූමිය බෞද්ධ පාලනයට අයත්කර දීමට හැකි විය. ඉන්දියානු බෞද්ධ උරුමය ආරක්ෂා කරදීම සඳහා 1891 දී මහාබෝධි සමාගම පිහිටවූ එතුමා එමගින් යළිත් භික්ෂූන් වහන්සේලා බෞද්ධ සිද්ධස්ථාන වල පදිංචි කරවූයේය. එතුමා **සාරානාත්** හි ඉදි කළ **මූලගන්ධකුටි විහාරය** විසි-වැනි සියවසේ ඉන්දීය බෞද්ධ පුනරු-දයේ සංකේතයක් වැනිය. මෙසේ ක්‍රි පූ 3 වන සියවසේ අශෝක අධිරාජයා දැක්වූ රාජ්‍ය අනුග්‍රහයෙන් ලංකාව ඇතුළු ආසියාතික රාජ්‍යයන් කරා පැතිරගිය බුදු දහම එහි මාතෘ භූමිය වූ ඉන්දියා-වෙන් අතුරුදහන්ව ගොස් තිබියදී 20 වන සියවසේ අනගාරික ධර්මපාලතුමන් විසින් යළිත් නගාසිටවනු ලැබීම අශෝක මහාධිරාජයාණන්ට කළ කෘතගුණ දැක්වීමක් බව කිව හැකිය. බුදුදහම ජාත්‍යන්තර වශයෙන් ව්‍යාප්ත කිරීමට අශෝක රජතුමන් ගත් උත්සාහය සම්පූර්ණ කරමින් මධ්‍යධරණී මුහුදු සීමාව ඉක්මවා බුදුදහම බටහිර දේශයට හඳුන්වා දීමට ස්ථාවර පදනමක් දැමීමට ධර්මපාලතුමන් සමත්විය. එහි ප්‍රතිඵලය වූයේ 1926 දී ලන්ඩන් බෞද්ධ විහාරය ආරම්භ කිරීමයි. 1928 දී ලංකාවෙන් වැඩම කළ ධර්මදූතවරුන් පදිංචිවීමෙන් ලන්ඩන් බෞද්ධ විහාරය මහා බ්‍රිතාන්‍යයේ ප්‍රථම බෞද්ධාරාමය බවට පත්විය. බ්‍රිතාන්‍ය ආගමික ඉතිහාසයේ බෞද්ධ පරිච්ඡේදයේ ධර්මපාලතුමාගේ නාමයට හිමිවන කීර්තිය ශ්‍රීලාංකික සැමට ඉමහත් ආඩම්බරයක් වන්නේය.

මෙම ක්‍රියාදාමයට පසුබිම් වූ 19 හා 20 සියවස් අතර කාල පරිච්ඡේදයේදී ඇමරිකානු හා බ්‍රිතාන්‍ය විද්වතුන්ගේ අවධානය දිනූ බෞද්ධ නියෝජිතයා මෙන්ම, කථිකයා ද වූයේ අනගාරික ධර්මපාලතුමාය. 1893 වසරේදී සුප්‍රසිද්ධ චිකාගෝ ආගමික සම්මේලනය අමතා **ලෝකය බුදුහිමියන්ට ණයගැතිය** යන එතුමා කළ දේශනය ඇසූ බොහෝ දෙනා බුදු දහමේ නව පිබිදීමක පෙර නිමිති දුටුවෝ ය. එසේම 1925 නිව්යෝර්ක් නගර ශාලාවේ එතුමාගේ දේශනය ඇසූ **New York Spectator** පුවත්පතේ කතුවර **Yeast Brown** මහතාගේ වාර්තාවේ ඇතුළත් දීර්ඝ විස්තරය අවසන් කර ඇත්තේ මෙසේය.

“ මේ නම් නියම පණිවුඩයක් දරණ පුරුෂයෙකි. සෘජු කායෙන් නොසැලී සිටි-මින් අසන්නන් මෙන්ම තමන්ද අවනත කරගනිමින් ඒ දේශනය කරන ලද්දේ චතුර දේශකයෙකුගේ නියම විලාශය හා ලෝකයම තඹයකට ගණන් නොගන්න පූජ්‍යයෙකුගේ ප්‍රතාපය ප්‍රදර්ශණය කරමිනි. ඔහු අසුන් ගත් කලද මොහොතකට පැතිරගියේ දැඩි නිහඬතාවකි. අත්පොලසන් හඬ පුපුරා හැලුනේ ඉන් පසුවය.”

## ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

### හිතොපදේශයෙන්

යෙෂාං න විද්‍යා න තපො න දානං
ඥාණං න සීලං න ගුණො න ධර්මට
තෙ මර්ත්‍යලොකෙ භව් භාර භූතා
මනුෂ්‍ය රූපෙන මෘගා චරන්ති

**අර්ථය** : *යම් අයට විද්‍යාව, තපස, දානය, ඥාණය, සීලය, ගුණය, ධර්මය යන මේවා නැත්තේද, මහ පොළවට බරක් වූ ඔවුන් මිනිස් රූපයෙන් හැසිරෙන තිරිසණුන් වැනිය.*

යමෙක් මෙලොව උපන්නොත් ඔහුගේ හෝ ඇයගේ ජීවිතය තමන්ටද අනුන්ටද යහපත් එකක් විය යුතුය. එහෙත් ඇතැම් අයගේ ක්‍රියාකාරකම් තුළින් පෙනෙන්නේ ඒ ජීවිත අනුන්ට කෙසේ වෙතත් තම ප්‍රයෝජනය සඳහාවත් නොපවතින බවයි. එම ජීවිත අන් අයට කරදරයක් මෙන්ම මහ පොළවටද බරකි. උදාර පුද්ගලයින් හැමදාම හැම තැනම පහළ නොවූවද යම් පමණකින් හෝ අනුනට ප්‍රයෝජනවත් පරාර්ථකාමී කෙනෙකු වීම උතුම් මිනිස්කමකි. එසේ නොවී ආහාරපාන ගනිමින්, කම්සුව විඳිමින් සහ නිදමින් පමණක් ජීවත්වන්නේ නම් එබන්දන් හා තිරිසනුන් අතර වෙනස කුමක්ද?

ඉහත සඳහන් පද්‍යයෙන් පහදා දෙන්නේද එවන් අදහසකි. මෙහි පුද්ගලයෙකු ප්‍රගුණ කලයුතු කරුණු 7 ක් සඳහන් වෙයි. සියල්ල කෙසේ වෙතත් ඉන් එකක් දෙකක් හෝ ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොකරන්නේ නම් එවැන්නන් මහ පොළවට බරක් මෙන්ද, මිනිස් රුව දරණ සත්වයින් වහයෙන්ද ලෙසද සඳහන් කෙරේ.

මින් පළමුවැන්න විද්‍යාවයි. ශිල්ප ශාස්ත්‍ර දැනුමයි. යමෙකුගේ ලෞකික ජීවිතය සාර්ථකව පවත්වාගෙන යන්නට මහෝපකාරීවෙයි.

දෙවැන්න තපසයි. තපස ඉන්දියානු ආගම් අතර මූලිකවූ දැඩි වෘතවල යෙදීමක් ලෙස දැක්වෙතත්, බුදු දහමේ උගන්වන තපස යනු උතුම් බ්‍රහ්මචර්‍යාවයි. අධ්‍යාත්මික විමුක්තිය උදෙසා කරනු ලබන උසස් ප්‍රතිපදාවක් ලෙසයි.

තෙවැන්න දන්දීමයි. උපයන දෙයින් ස්වල්පයක් හෝ දන්දීමයි. මසුරුකම දුරලා පරිත්‍යාගීවීමයි. කාරුණිකව අන් අයට උදව් උපකාරකිරීමයි.


සිව්වෙනි කරුණ ඥාණාන්විත බවයි. ඥාණාන්විතව කටයුතු කිරීමට ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීම පමණක් ප්‍රමාණවත් නොවේ. තමා ජීවත්වන පරිසරයත් සමාජයත් ආදර්ශයට ගනිමින් ස්ථානෝචිත ප්‍රඥාව පුද්ගලයෙකු සතුව තිබිය යුතුයි.

පස්වෙනුව එන්නේ සීල සංවරයයි. නොහොත් හික්මීමයි. දරදඬු බව, නොහික්මුණු බව සමාජ ව්‍යසනයන්ට හේතුවන හෙයින් කාය, වාග් සංවරය හෙවත් ඉඳුරන්ගේ දැමුණු බව මිනිසා නිවුණු ශාන්ත පුද්ගලයෙකු බවටත් නිවුණු කෙනෙකු බවටත් පත් කරයි. ශිෂ්ට සම්පන්න සමාජයක් තනන්නට නම් හැමෝම ශීලාචාරවත් විය යුතුයි.

හයවෙනි කරුණ නම් ගුණවත් බවයි. කෙනක් අන් දේවල් වලින් අඩු වැඩි වුවද ගුණධර්ම වලින් පොහොසත් නම් එයම ඔහුගේ ජීවිතය සැපවත් කරගැනීමටත් සමාජයෙන් බුහුමන් ලැබීමටත් හේතුවක් වන්නේය. ගුණදහ මින් පොහොසත් පුද්ගලයා අනෙකුත් වත් පොහොසත් කම් දැන උගත්කම් නැතිවුවද ශිෂ්ඨ සමාජයේ පිළිගැණේ. එහෙත් බොහෝ දෙනෙකුට යහමින් මිළමුදල් හා ප්‍රසිද්ධිය ඔවුන් වෙත ළඟාවන විට අනෙකුත් ගුණ ධර්ම පලායනු පෙනේ.

මෙහි අවසන් කරුණ යමෙක් ධර්මානුකූල විය යුතු බවයි. ධාර්මික ජීවිතයක් ගතකිරීම යනු ලෞකික ජීවිතයක ලැබිය හැකි අග්‍ර ඵලය මෙන්ම, අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා එය තවදුරටත් උපයෝගී කර ගැනීමයි. ධර්මය සමාජ සංස්කෘතික හරයන් කෙරෙන් බැහැර යන මෙවන් අවධියක එහි අගය දන්නෝ ඉතා විරල වෙති. ධර්මයෙන් තොරවූවන් තිරිසනුන් මෙනැයි පෙර පඬුවන් සඳහන්කර ඇත්තේ එහෙයිනි.

♦ රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති
පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි



ලන්ඩන් බෞද්ධ විහාරය
London Buddhist Viharaya
The Avenue
London W4 1UD UK


NORMA & Co
Associate Solicitors

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772 / 07717173414

Any type of Visa Applications
Car Accidents

Colombo Office
Visa Applications & Any Refusals
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632